**බස්නාහිර පළාත් සභාව 2019**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

බස්නාහිර පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2020 නොවැම්බර් 18 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 18 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම රු.3,523,893,679 ක් සහ පසුගිය වර්ෂයේ අවසානයට තිබිය යුතු ශේෂය වූ රු.8,081,758,371 ක් සමඟ මූල්‍ය නොවන වත්කම් එකතු වටිනාකම රු.11,605,652,050 ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.3,911,333,331 ක් ලෙස රු.7,694,318,719 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සියළු වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වේ. | පළාත් සභා ගිණුම්වල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම ආරම්භ කරන ලද්දේ 2019 වර්ෂයේ සිටය. 2019.12.27 දිනැති අංක 17/2019 චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයේ වත්කම් ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී තිබූ අතර ආරම්භක ශේෂයන් ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාලපරිච්ඡේදය ආරම්භයේ හා අවසානයේ සභාවේ දේපළ, පිරියත හා උපකරණවල දළ ධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාව සතු රු.8,081,758,371 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | සියළු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වේ. | ආරම්භක ශේෂයන් ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී නොමැත. ඉදිරි වර්ෂයේ ගිණුම්ගත කිරීමට බලාපොරොත්තු වේ. |

**1.2.2** නොසැසඳූ ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභාව යටතේ තිබෙන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.61,380,717,789 ක්වූ නමුත් පළාත් භාණ්ඩාගාර පොත් සහ අරමුදල් ගිණුමේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව පුනරාවර්තන වියදම රු.61,380,218,434 ක් වූයෙන් රු.499,355 ක වෙනසක් විය. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | වෙනස පවතින කාර්යාල කවරේද යන්න සොයා බලා භාණ්ඩාගාර පොත් සමඟ වෙනසක් පවතී නම් ඒවා නිවැරදි කර ගන්නා ලෙස දැනුම්දීමට කටයුතු කරමි. |
| (ආ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම රු.7,592,003,271 ක්වූ නමුත් භාණ්ඩාගාර පොත් සහ අරමුදල් ගිණුමේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මූලධන වියදම රු.7,591,646,612 ක් වූයෙන් රු.356,659 ක වෙනසක් විය. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | වෙනස පවතින කාර්යාල කවරේද යන්න සොයා බලා භාණ්ඩාගාර පොත් සමඟ වෙනසක් පවතී නම් ඒවා නිවැරදි කර ගන්නා ලෙස දැනුම්දීමට කටයුතු කරමි. |
| (ඇ) | අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 07 ක මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පාඩු හා කපා හැරීම් වටිනාකම රු.5,309,144 ක් වූ නමුත් අරමුදල් ගිණුම අනුව එම වටිනාකම රු.540,690 ක් වූයෙන් රු.4,768,454 ක වෙනසක් විය. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | ගිණුම්ගත කිරීම් නිසි ආකාරයෙන් සිදු කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයයන් 02 කට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.1,304,695,679 ක් වූ නමුත් අරමුදල් ගිණුම අනුව එම ශේෂය රු.1,301,982,859 ක් වූයෙන් රු.2,712,820 ක නොසැසඳීමක් විය. එසේම එම අත්තිකාරම් ගිණුම් විෂයයන් 02 ට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.1,308,881,999 ක් හා අරමුදල් ගිණුම අනුව එම ශේෂය රු.1,307,525,750 ක් වූයෙන් රු.1,356,249 ක නොසැසඳීමක් විය. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | වෙනස්වීම් හැකි ඉක්මනින් නිවැරදි කර ගන්නා ලෙස දැනුම්දී ඇත. |
| (ඉ) | පළාත් දෙපාර්තමේන්තු 02 කට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේ තැන්පතු ශේෂය රු.134,325,097 ක් වූ නමුත් අරමුදල් ගිණුම අනුව ශේෂය රු.143,830,283 ක් වූයෙන් එම ශේෂයන් අතර රු.9,505,786 ක නොසැසඳීමක් විය. එසේම එම තැන්පතු ගිණුම් 02 ට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.141,225,870 ක් හා අරමුදල් ගිණුම අනුව ශේෂය රු.138,634,042 ක් වූයෙන් එම ශේෂයන් අතර රු.2,591,828 ක නොසැසඳීමක් විය. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | වෙනස්වීම් හැකි ඉක්මනින් නිවැරදි කර ගන්නා ලෙස දැනුම්දී ඇත. |
| (ඊ) | දෙපාර්තමේන්තු 03 කට අදාල මූල්‍ය ප්‍රකාශයන්හි සමාලෝචිත වර්ෂය අවසානයේ භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු වටිනාකම රු.159,613,390 ක් වූ නමුත් අරමුදල් ගිණුම අනුව තැන්පතු වටිනාකම රු.273,628,245 ක් වූයෙන් එම ශේෂයන් අතර රු.114,014,855 ක නොසැසඳීමක් විය. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | වෙනස්වීම් හැකි ඉක්මනින් නිවැරදි කර ගන්නා ලෙස දැනුම්දී ඇති අතර පසුවිපරම් කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (උ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් මිලදීගැනීම වෙනුවෙන් දරන ලද වියදම සහ අරමුදල් ගිණුම අනුව එම වියදම අතර රු.613,269,479 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. | කොටසක් වත්කම් ලෙසත් කොටසක් වත්කම් නොවන වියදම් ලෙසත් හඳුනාගෙන ඇති අතර වෙනස්කම් සොයාබලා නිවැරදි කර ගන්නා ලෙසත් අදාළ කාර්යාල වෙත දැනුම්දී ඇත. |

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ දෙකටන පද්මවතී මහා විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමයේ ඉතිරි කිරීමේ ගිණුමට 2016 සිට 2018 වර්ෂය දක්වා ලැබී තිබූ රු.5,798,188 ක පරිත්‍යාග මුදල් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. එසේම එම ආදිශිෂ්‍ය සංගමයේ ඉතිරි කිරීමේ ගිණුමින් 2015 සිට 2019 වර්ෂය දක්වා ඉවත් කරගෙන තිබූ රු.3,952,410 කින් කරන ලද ගෙවීම්වලට අදාළ වූ ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | අදාළ ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වේ. | ඉතිරි කිරීමේ ගිණුමට ලැබෙන මුදල් සඳහා කුවිතාන්සි නිකුත් කළ යුතු බව නොදැන සිටීම නිසා මෙසේ සිදුවී ඇත. |

### 1.2.4 නොපියවූ ගිණුම්

#### (අ) අග්‍රිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම සීමාව ඉක්මවා රු.654,768 ක් වියදම් කර තිබූ අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අදාළව නිරවුල් නොකරන ලද රු.317,051,869 ක් වටිනා අග්‍රිම ශේෂ පැවතුණි. | ගිණුම් වර්ෂය අවසානයේ සියළු අග්‍රිම ශේෂ නිරවුල් කරගත යුතු වේ. | රජයේ සැපයීම් වෙනුවෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.මිලියන 317 ක මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) **ප්‍රේෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සහ කඩුවෙල, කටාන, මීගමුව සහ මදුරාවල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිරවුල් නොකළ ප්‍රේෂණ ශේෂ එකතුව රු.98,285,128 ක් විය. | ප්‍රේෂණ ශේෂ නිරවුල් කරගත යුතු වේ. | නිරවුල් කළ යුතු ශේෂ අයත් කාර්යාලවලට දැනුම්දී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) **වෙනත් අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විෂය අංක 10903 පළාත් සභා මුදල්, මුද්දර හා එවැනි මූල්‍යමය වටිනාකමක් ඇති ඒවා නැතිවීම් ගිණුම්ගත කිරීමේ අත්තිකාරම් ගිණුම යටතේ 2014 වර්ෂයේදී මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබූ රු.915,786 ක අත්තිකාරම් මුදල නිරවුල් කරවා ගෙන නොතිබුණි. | අත්තිකාරම් මුදල නිරවුල් කරවාගත යුතු වේ. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමා 2020.08.28 දිනැති ලිපිය මගින් දැනුවත් කර ඇති අතර තීරණය ලද විගස අත්තිකාරම් මුදල පියවන බව මහර ප්‍රාදේශීය ලේකම් දැනුම් දී ඇත. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

  මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්ව ඇත.

(අ) 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 අනුකූල නොවීම්

### 1.6.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටි හා රීති සංග්‍රහයේ xviii පරිච්ඡේදයේ 192(iii) වගන්තිය | - | බස්නාහිර පළාතේ සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2019 සැප්තැම්බර් 30 දිනට සේවා කාලය අවුරුදු 05 ට වැඩි සංවර්ධන නිලධාරීන් 35 දෙනෙකු ස්ථානමාරු නොවී එකම සේවා ස්ථානයේ දීර්ඝ කාලයක් සේවය කරමින් තිබුණි. | රීති ප්‍රකාර මාරුවීම් ක්‍රියාත්මක කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 272(3) | 10,523,896 | කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2019 ජනවාරි සිට මාර්තු දක්වා මාස තුනෙහි රු.10,523,896 ක වටිනාකම වූ වවුචර් 76 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 6,907,698 | නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 1991 වර්ෂයේ සිට හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2011 වර්ෂයේ සිට පැවත එන පොදු තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කළ යුතු වේ. | කොටසක් රජයේ ආදායමටද කොටසක් රැඳවුම් මුදල් වශයෙන්ද නිදහස් කර ඇත. |
| (ඇ) | බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති 106.7 | 3,475,117 | බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාතේ ධාරිතා සංවර්ධනය සහ අන්තර් පළාත් සංවර්ධන අත්දැකීම් හුවමාරු කර ගැනීම වශයෙන් වැඩසටහන් දෙකක් බස්නාහිර පළාතෙන් පරිබාහිරව වෙනත් පළාත් දෙකක පවත්වා තිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයේ (v) වගන්තිය | 15,828,875 | ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් නිල වශයෙන් /රාජකාරීමය නිශ්චිත සහභාගීත්වයක් අත්‍යවශ්‍ය නොවන්නේ නම් දේශීය අරමුදල් මඟින් වියදම් දරමින් සම්මන්ත්‍රණ / වැඩමුළු ආදිය සඳහා නිලධාරීන් සහභාගී නොකළ යුතු වුවත් 2019 අගෝස්තු 27 සිට 2019 සැප්තැම්බර් 02 දක්වා වියට්නාමයේ පැවති වැඩසටහනකට නිලධාරීන් 05 දෙනෙකු හා 2019 ජුනි 15 සිට 21 දින දක්වා ජපානයේ පැවති වැඩසටහනකට නිලධාරීන් 05 දෙනෙකු සහභාගී කරවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගත විය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | බස්නාහිර පළාත් 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතිවල 5 හා 6 වගන්ති | 28,845,738 | ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට වයස අවුරුදු 56 ඉක්මවූ සේවකයෙකුට රීතිවල උපලේඛන දෙක ප්‍රකාරව විශ්‍රාම වැටුප් හිමිකම විය යුත්තේ විශ්‍රාම යන වයසේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට 40ක ප්‍රමාණයකි. එහෙත් 2019 දෙසැම්බර් 31 දින වනවිට වයස අවුරුදු 56 ඉක්මවූ පළාත් සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලේ සේවකයින් 114 දෙනෙකුට සියයට 40 කට වඩා වැඩි ප්‍රතිශතයක් විශ්‍රාම වැටුප වශයෙන් ගෙවා තිබුණි. | රීති ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**1.7 විධිමත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සියළුම ආණ්ඩුකාරවරු හා සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු ඇමතූ අංක CSA/1/4 හා 2017 ජනවාරි 26 දිනැති ජනාධිපති ලේකම්වරයාගේ ලිපියේ 02 ඡේදය ප්‍රකාරව විදේශගත වන කණ්ඩායමේ සංඛ්‍යාව 05 ට අඩු නම් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු අතර, 03 ඡේදය ප්‍රකාරව විදේශගත | ලිපිය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

වන සංඛ්‍යාව 05 ට වැඩි නම් භාණ්ඩාගාරයේ අනුමැතියට අමතරව ජනාධිපති කාර්යාලයේ අනුමැතියද ලබාගත යුතුය. එසේ වුවත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත පමණක් පළාත් සභාව විසින් රු.66,785,288 ක් වියදමක් දරමින් නිලධාරීන් 21 දෙනෙකු හා මහජන නියෝජිතයින් 28 දෙනෙකු 2018 හා 2019 වර්ෂවලදී විදේශ සංචාර 13 ක් සඳහා සහභාගි කරවා තිබුණි.

**2. ආදායම් කළමනාකරණය**

--------------------------

**2.1 මුද්දර ගාස්තු**

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ X වන පරිච්ඡේදය ප්‍රකාරව අයකරනු ලබන මුද්දර ගාස්තු, මහා නගර සභා ආඥා පනතේ 185(2)(ඇ), නගර සභා ආඥා පනතේ 158(2)(ආ) සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2)(ආ) යන වගන්තිවල විධිවිධානවලට අනුකූලව අදාළ පළාත් පාලන ආයතනයේ අරමුදලට බැර කළ යුතුය. නමුත් බස්නාහිර පළාත් සභාව විසින් රැස්කරන ලද මුද්දර ගාස්තු අදාළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කරන තෙක් බැරකමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර එම ආදායම පළාත් සභාවේ ආදායමක් ලෙස සළකා ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයට අදාළව ගිණුම්ගත කර තිබුණු මුද්දර ගාස්තු ආදායම රු.13,488,503,503 ක් හා 2018 වර්ෂයට අදාළව ගිණුම්ගත කළ මුද්දර ගාස්තු ආදායම රු.17,284,582,079 ක් විය. | ආදායමක් ලෙස නොව බැරකමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 2.2 හිඟ ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් සභාව විසින් ආදායම් සංකේත 30 ක් යටතේ ආදායම් රැස්කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වනවිට එයින් ආදායම් සංකේත 16 කට අදාලව රු.2,981,468,415 ක හිඟ ආදායමක් පැවතුණි. | හිඟ මුදල් අය කරගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.2,441,053,486 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,322,890,536 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,118,162,950 කින් තවදුරටත් පිරිහී තිබුණු බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව මුළු බදු සහ බදු නොවන ආදායම රු.2,186,264,474 කින් අඩුවීම හා පුනරාවර්තන වියදම රු.4,574,852,927 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩි වීමට හේතු වී තිබුණි.

## 04. ප්‍රඥප්ති ගිණුම්/අරමුදල් ගිණුම් හා පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### 4.1 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්

#### 4.1.1 ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් වෙස්ප්‍රෝ ආරක්ෂක අංශ ව්‍යාපෘතියෙන් ව්‍යාපෘති අධීක්ෂණ දීමනාවක් ලෙස 2018 වර්ෂයේදී රු.685,000 ක් හා 2019 වර්ෂයේදී රු.780,000 ක් ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු නිලධාරීන් 04 දෙනෙකුට ගෙවා තිබුණි. 2013 වර්ෂයේ සිට ඉන්ධන දීමනාවක් ලෙස ගෙවූ මෙම දීමනාව 2018 මාර්තු මස සිට ව්‍යාපෘති අධීක්ෂණ දීමනාව ලෙස දීමනා නාමය වෙනස් කර ගෙවා තිබුණි. | පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙස්ප්‍රෝ කාර්යාලීය පරිශ්‍ර ආශ්‍රිත සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියේ සේවාවන් සැපයීම වෙනුවෙන් ව්‍යාපෘති දීමනාවක් ලෙස ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්යාංශයේ නිලධාරීන් 17 දෙනෙකුට 2018 වර්ෂයේදී රු.905,887 ක් හා 2019 වර්ෂයේදී රු.1,505,823 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ගෙවා තිබුණි. | පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**4.1.2 අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය**

------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------- | ------------------------------ |
| (අ) | පළාත් පාලන ආයතන 16 කින් ලැබිය යුතු බවට හඳුනාගෙන ගිණුම්ගත කර තිබූ කසළ සැපයීම්, වාහන බලපත්‍ර ගාස්තු හා රක්ෂණ ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම් වෙනුවෙන් රු.96,747,745 ක් පැවති අතර පළාත් පාලන ආයතන 4 ක පමණක් මූල්‍ය ප්‍රකාශන තුළ රු.50,170,363 ක් අධිකාරියට ගෙවිය යුතු බවට ගිණුම්ගත කර තිබුණි. | නිසි සන්නිවේදනයකින් හා විධිමත් පටිපාටීන් අනුව ණය ගනුදෙනු ගිණුම්ගත කළ යුතු වේ. | මෙම සේවාව අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස සලකා වසර පුරාම අඛණ්ඩව සපයනු ලබන අතර ශේෂයන් අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලබයි. |
| (ආ) | අධිකාරිය විසින් කළමනාකරණ කටයුතු සිදුකරන පිළියන්දල තුම්බෝවිල අක්කර 25 ක භූමියෙහි පිහිටි කරදියාන කසළ අංගනයට කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 07 කින් කසළ බැහැර කරන නමුත් ජාතික පරිසර පනතේ විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මෙම ස්ථානය පවත්වාගෙන යමින් තිබුණි. | අදාළ අනුමැතීන් ලබාගත යුතු වේ. | NBRO විසින් නිකුත් කරන ලද අවසන් වාර්තාවේ නිර්දේශයන් අනුව කටයුතු කරමින් සිටී. |

### 4.1.3 සමූපකාර අරමුදල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමූපකාර සමිති සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.220,194,447 ක් ණය වශයෙන් ලබාදී තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව සමස්ත ලැබිය යුතු ණය ශේෂය රු.416,688,619 ක් විය. සමූපකාර සමිතිවලට ණය ලබාදීම සඳහා නිශ්චිත ලිඛිත කොන්දේසි හා ඇප සුරක්ෂණ පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණි. එසේම සමූපකාර අරමුදලේ දායක මුදල් හිඟහිට ඇති අවස්ථාවන්හිදීද සමිති සඳහා ණය ලබාදී තිබුණි. තවද වර්ෂ 05ක ගෙවීම් කාල පරිච්ඡේදයකට යටත්ව සමූපකාර සමිති සඳහා ලබාදී තිබුණු ණයවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 05ක් ඉක්මවූ ණය ශේෂය රු.11,585,824 ක් විය. | ලිඛිත කොන්දේසි හා ඇප සුරක්ෂණ පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සකස් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 4.1.4 සමූපකාර ඇවර අරමුදල

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමූපකාර ඇවර ගිණුමට අයත් සමිති 61 ක් 2019 වර්ෂය ආරම්භයේදී ඇවර කිරීමට නියමිතව පැවති නමුත් වර්ෂය අවසානයේදී එක් සමිතියක පමණක් ඇවර කටයුතු නිම කර තිබුණි. | ඇවර කිරීම් කටයුතු කඩිනම් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | සී/ස කොළඹ - උතුර සමූපකාර සමිතියේ ඇවර කටයුතු සිදු කිරීම සඳහා වසර 35 කට අධික කාලයක් තුළ ඇවරකරුවන් දසදෙනෙකු පත් කර තිබුණු නමුත් එම ඇවර කටයුතු අවසන් කර නොතිබුණි. මෙම සමිතිය සතුව පවතින ඉඩම් 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වෙන්දේසි කර ගැනීමට නොහැකි වී තිබුණු අතර එයද මෙම ඇවර කටයුතු ප්‍රමාද වීම සඳහා බලපා තිබුණි. | ප්‍රමාදයකින් තොරව ඇවර කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සී/ස කොළඹ කොමර්ෂල් ඉංජිනේරු (ස.ණ.ස.) සමිතියේ ලියාපදිංචිය අවලංගු කර වසර 16 ක් ඉක්මවා තිබුණද ඇවර කටයුතු අවසන් කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව ඇවර කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන සමූපකාර සමිති 10 කට අධික ප්‍රමාණයක් පැවති අතර එම සමිති සම්බන්ධයෙන් පවතින නීති ප්‍රකාරව කටයුතු කිරීමට හෝ එම නීති ප්‍රමාණවත් නොමැතිනම් නව නීති සම්පාදනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ප්‍රමාණවත් පරිදි නීති සම්පාදනය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**4.1.5 පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය 2011 වර්ෂයේ සිට 2018 දක්වා වසර 08 ක් අඛණ්ඩව ව්‍යාචනය කිරීමට සිදුව තිබුණි. | ගිණුම්වල පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රු.මිලියන 235 ක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පවරා තිබූ කොන්ත්‍රාත්තුවක් අවසන් කිරීමට අධිකාරිය විසින් 2006 වර්ෂයේදී තීරණය කිරීම නිසා රු.මිලියන 90 ක වන්දියක් හා ඊට අදාල සියයට 11.3 ක නෛතික පොළිය ගෙවිය යුතු බව බේරුම් කාරක මණ්ඩලය විසින් 2012 වර්ෂයේ තීරණය කර තිබුණි. ඒ සම්බන්ධව අධිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකාරණය වෙත ඉදිරිපත් කළ අභියාචනය 2018 අගෝස්තු 31 දින නිෂ්ප්‍රභා කිරීම නිසා 2019 වර්ෂයේදී රු.මිලියන 190.2 ක වන්දියක් ගෙවීමට සිදුවී තිබුණි. මෙකී පාඩුව සිදුවී වසර 06 ක් ගතවී ඇතත් දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය හේතුවෙන් පළාත් මූල්‍ය රීති 51, 52.1, 54 සහ 55 යටතේ වන පරිපාටීන් අනුගමනය කර වගකිව | රීති ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | යුතු නිළධාරීන් හඳුනා ගැනීම හා පළාත් මූල්‍ය රීති 76.1.8 හා 106 යටතේ වන කාර්ය පටිපාටීන් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 2011 සිට 2014 වර්ෂය දක්වා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ කිහිපයක රන් අරුණ I,II,III වැඩසටහන් යටතේ මාර්ග කාපට් කිරීම හා දිවිනැගුම වැඩසටහන් යටතේ සතිපොළ හා මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන ඉදිකිරීම් ඇතුළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු බවට ගිණුම්ගත කර තිබූ රු.මිලියන 3,224 ක් 2020 අගෝස්තු දින දක්වාත් අය කර ගෙන නොතිබුණි. | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | අස්ගිරිය, මොරගහහේන හා රත්මලාන ප්‍රාදේශිය යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල මගින් යන්ත්‍ර කුළියට දීම හා අළුත්වැඩියා වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 24 ක් අය විය යුතුව පැවතුණි. ඒ අතර 1996 වර්ෂයේ සිට පැවත එන ශේෂයන්ද පැවතුණි. මේ සම්බන්ධව පළාත් මූල්‍ය රීති 51, 52.1, 54 සහ 55 යටතේ වන පටිපාටීන් අනුගමනය කර වගකිව යුතු නිළධාරීන් හඳුනා ගැනීම හා පළාත් රීති 76.1.8 හා 106 යටතේ වන කාර්ය පටිපාටීන් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | අධිකාරිය වෙත රජයෙන් ලැබිය යුතුව ඇති ශේෂ හා එකිනෙකට බැඳී පවත්නා කොන්ත්‍රාත් කරුවන්ට ගෙවිය යුතු රු.මි.1,297 ක ශේෂයක් 2019 දෙසැම්බර් 31 දිනට සහතික නොකළ බිල්පත් ලෙස පැවතුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සංවර්ධන ප්‍රදාන (PSDG හා PDG) යටතේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා 2016, 2017 හා 2018 වර්ෂවලදී පළාත් භාණ්ඩාගාරය විසින් ලබාදුන් මුදල්වලින් රු.මි 89.56 ක් මාර්ග සංවර්ධන කටයුතු සඳහා භාවිතා නොකර 2019 වර්ෂයේදී සංචිත වෙත මාරු කර තිබුණි. | අදාළ මුදල් සංවර්ධන කටයුතු වෙනුවෙන් භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (උ) | (i) ජපාන විශ්ව විද්‍යාලයක් මගින් සංවිධානය කර තිබූ ජපානයේ මාර්ග සංවර්ධනය පිළිබඳ උපායශීලී ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව ලෙස හඳුන්වා ඇති වැඩසටහනක් සඳහා 2019 ජූනි 15 දින සිට ජූනි 21 දින දක්වා නිලධාරීන් 04 දෙනෙකු සහභාගිවී තිබුණි. ඊට අදාල පාඨමාලා ගාස්තු වශයෙන් රු.5,178,530 ක් (ඇ.ඩො. 29,000 ක්) දේශීය පුද්ගලික ආයතනයක් වෙතද නිලධාරීන් 04 දෙනා සඳහා අනියම් දීමනා හා සංයුක්ත දීමනා වශයෙන් රු.2,741,374 ක්ද (ඇ.ඩො. 15,190 ක්) ගෙවා තිබුණි. එහෙත් මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඍජු සම්බන්ධතාවයක් නොමැති නිලධාරීන් දෙදෙනෙකුද එම සමුළුවට සහභාගිවී තිබුණි. | ඍජු සම්බන්ධතාවයක් පවතින නිලධාරීන් සහභාගී කරවිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| | (ii)මෙහිදී පස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සඳහා එක් අයෙකුට ඇ.ඩො 5,750 බැගින් ඇ.ඩො. 28,750 ක් පාඨමාලා ගාස්තු ලෙස ගෙවා තිබුණි. එහෙත් සහභාගීවී තිබුණේ හතර දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් බැවින් ඇ.ඩො. 5,750 කට සමාන වටිනාකම වූ රු.1,037,875 ක් ආපසු අයකරගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඖ) | විවිධ ව්‍යාපෘති හා කාර්යයන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව, මිනිස්බල අවශ්‍යතාවයේ ප්‍රමාණය පිළිබඳ තක්සේරු කිරීමකින් තොරව හා පූර්ව මිනිස් බල සැලසුමක් සකස් කිරීමකින් තොරව තදුවිත පදනම යටතේ 424 දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම යටතේ 161 දෙනෙකු අධිකාරිය විසින් සේවයේ යොදවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයක් පමණක් සේවයේ යෙදවිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ක) | පළාත් මාර්ග කාපට් ඇතිරීම සඳහා 2012 වර්ෂයේදී එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අධිකාරියට ලැබුණු යන්ත්‍රෝපකරණ උපයෝජනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.<br><br>(i) 2012 වර්ෂයේදී චීන ණය ආධාර යටතේ ලැබී තිබූ යන්ත්‍රෝපකරණ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු මුදලින් රු.මි.40 ක් සබරගමු පළාත් සභාවට සැපයූ සේවා සඳහා ලැබිය යුතු මුදලින් අඩු කිරීමට තීරණය කර තිබිය දී අධිකාරිය විසින් රු.මි.45.07 ක් අඩු කිරීම හේතුවෙන් අමාත්‍යාංශය වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස රු.5,068,165 ක් 2015 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ලැබිය යුතු ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. | අදහස් දක්වා නොමැත. |
| | (ii) 2019 දෙසැම්බර් 31 දින වනවිට පාවිච්චියෙන් ඉවත් කළ යන්ත්‍රෝපකරණ ඒකක 26 ක් අවුරුදු 01 මාස 04 සිට අවුරුදු 07 මාස 08 දක්වා කාලපරාසයක් අළුත්වැඩියාවකින් තොරව මොරගහහේන යන්ත්‍රාගාරයේ නවතා තිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සාමාන්‍ය නීතියට අනුව ආයතනය මෙහෙයවීම මූලික කළමනාකරණ වගකීම වුවත් සිවිල් නීතියට අනුකූලව කර තිබීම හේතුවෙන්,<br>(i). කැලණිය කිරිබත්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීමේදී පාර්ශවකරුවන් 58 ක් පැවරූ නඩුවකින් 215 දෙනෙකු හට රු.මි 104 මුදලක් ගෙවීමට නියමිතව තිබුණි.<br>(ii) මාර්ග සංවර්ධන කටයුතු ඉටු කිරීමේදී මහජන දේපලවලට හානි කිරීම, සිවිල් නීති රීතින්ට අනුකූලව කටයුතු නොකිරීම සහ කොන්ත්‍රාත් මුදල් නොගෙවීම සම්බන්ධව අධිකාරියට එරෙහිව නඩු 12 ක් පවරා තිබුණි. | සාමාන්‍ය නීතියට අනුව ආයතනය මෙහෙයවීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 4.1.6 සංචාරක මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1994 වර්ෂයේදී සම්මත කරන ලද 1994 අංක 3 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තියට අදාළව සංචාරක මණ්ඩලය සඳහා රීති සකස් කර සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | සංචාරක මණ්ඩලය විසින් මීගමුව ඒත්තුකාළ ජල උද්‍යානයේ මෙහෙයුම්, පරිපාලන හා නඩත්තු කටයුතු 2019 පෙබරවාරි 20 දින සිට වසර 03 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් මඟින් මීගමුව මහනගර සභාවට ලබා දී තිබුණි. අවබෝධතා ගිවිසුමේ (3) වන කොන්දේසිය ප්‍රකාරව ජල උද්‍යානයේ මෙහෙයුම්, පාලන හා නඩත්තු කටයුතු කරගෙනයාම සඳහා පළමු පාර්ශවයේ අනුමැතිය සහිතව තෙවන පාර්ශවයක් සමඟ ගිවිසුම්ගත වීමේ හැකියාව දෙවන පාර්ශවයට ඇති නමුත් පළමු පාර්ශවයේ අනුමැතිය | ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

නොලබා තෙවන පාර්ශවයක් වෙත එම කටයුතු කරගෙන යාමට අවසර ලබාදී තිබුණි. එසේම අවබෝධතා ගිවිසුමේ (4) වන කොන්දේසිය ප්‍රකාරව ජල උද්‍යානය අතුරු බදු දී ලැබෙන මාසික බදු මුදලින් සියයට 30 ක් දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලබාදිය යුතුය. එහෙත් දෙවන පාර්ශවය තුන්වන පාර්ශවය සමඟ එළඹී ගිවිසුමේ පිටපතක් මණ්ඩලය සතුව නොතිබීම හේතුවෙන් ජල උද්‍යානය බදු දීමෙන් මණ්ඩලයට ලැබෙන මාසික බදු මුදලේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 4.2 පළාත් සහා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට වෙනත් පළාත් සහා 7 කට ස්ථාන මාරු වී ගොස් තිබූ නිලධාරීන් 25 දෙනෙකුගෙන් සහ පළාත් පාලන ආයතනවලට ස්ථානමාරුවී ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂ පිළිවෙලින් රු.1,856,270 ක් සහ රු.1,636,785 ක් වූ අතර එම ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් සහා 07 කට ස්ථාන මාරුවී ගොස් තිබෙන නිලධාරීන් 25 දෙනෙකුගෙන් රු.1,856,270 ක්ද පළාත් පාලන ආයතනවලට මාරුවී ගිය නිලධාරීන් 14 කින් රු.1,739,140 ක් අයවීමට තිබේ. |
| (ආ) | ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 30 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය මුදල රු.1,882,869 ක් වූ අතර නිලධාරීන් විශ්‍රාම යාමේදී ඔවුන්ගේ පාරිතෝෂිකයෙන්ද, මියගිය නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිකයෙන්ද ණය මුදල් අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම මත සැලකිය යුතු ණය ප්‍රමාණයක් එකතු වී තිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු වේ. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 30 දෙනෙකුගෙන් රු.906,069 ක් තවදුරටත් අයවීමට ඇත. |

**5. මෙහෙයුම් සමාලෝචනය**

**5.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය අංශයේ මෙහෙයුම් කටයුතු කිරීමේ අරමුණෙන් පරිගණක මෘදුකාංග මෙහෙයුම් පද්ධතියක් මිලට ගැනීම සඳහා 2018 වර්ෂයේදී රු.7,711,500 ක් ගෙවා තිබුණි. නමුත් මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වාදී ඇති නව සිගාස් වැඩසටහන යටතේ ඒකාබද්ධ ගිණුම් තොරතුරු ලබා ගැනීමේ පහසුකම පවතින බැවින් මෙවැනි වියදම් දැරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. | වියදමේ ඵලදායීතාවය පිළිබඳව සලකා බැලිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | 2019 අප්‍රේල් 21 සිට 27 දක්වා රුසියාවේ පවත්වන ලද යහපාලනය හා රාජ්‍ය අංශය තුළ නායකත්වය පිළිබඳ විදේශ අධ්‍යයන වැඩසටහන අවලංගු කරන ලෙස අතිගරු ජනාධිපතිවරයා විසින් දන්වා තිබියදී පළාත් සභාවේ සභාපති සහ සභා ලේකම් ඒ සඳහා සහභාගි වීම වෙනුවෙන් දරා තිබූ වියදම රු.2,359,800 ක් විය. | රාජ්‍ය නායකයාගේ නියෝග / උපදෙස් පිළිපැදීම නිලධාරීන්ගේ වගකීමකි. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රදාන වැඩසටහන - 2019 ක්‍රීඩා සංරචකය යටතේ 2019 ඔක්තෝබර් 27 දින පැවති ජාතික මහා ක්‍රීඩා උළෙල නියෝජනය කරනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට, නිලධාරීන්ට හා කාර්යාල කාර්ය සහායකයින්ට සපත්තු හා ගමන් මළු ලබාදීම සඳහා (රු.6,475 බැගින් සපත්තු 890 ක් සහ රු.1,300 බැගින් ගමන්මලු 863 ක් සඳහා) රු.6,884,650 ක් 2019 නොවැම්බර් 04 සහ දෙසැම්බර් 26 දිනවලදී පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. මෙම භාණ්ඩ ක්‍රීඩා උළෙල නිමවීමෙන් පසුව | අදාළ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගැනීම හේතුවෙන් 2020 ජනවාරි 17 දින වන විට සපත්තු 636 ක් සහ ගමන්මලු 629 ක් ගබඩාවේ ඉතිරිව පැවතුණි. තවද බෙදන ලද සපත්තු 254 ක් සහ ගමන්මලු 234 ක් ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොවන අය අතරේ බෙදා හැර තිබුණි. | | |
| (ඇ) | බෙම්මුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිල නිවස රු.5,000 ක මාසික කුලියක් යටතේ තාවකාලික පදනමින් පොලිස් මුරපොලක් පවත්වාගෙන යාම සඳහා 2009 පෙබරවාරි 28 දින පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. මෙම ගොඩනැගිල්ල ලබාදී වර්ෂ 10 ක් සම්පූර්ණ වී තිබුණද මාසික කුලී මුදල අයකර ගැනීමට හෝ නිල නිවස ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිල නිවාස ආපසු ලබා ගැනීමට හෝ කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බණ්ඩාරගම, දොඩන්ගොඩ සහ අගලවත්ත යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල නියමිත ප්‍රමිතියට අනුකූල නොවීම මත 2016 වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කරන ලද Ferrous Sulphate Tablet 22 mg පෙති 803,200 ක් 2019 ජනවාරි 19 දින වන විටත් අපහරණය කර නොතිබුණි. | අපහරණය සඳහා පියවර ගත යුතුයි. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | කළුතර අධ්‍යාපන කලාපයේ පොතුපිටිය මහා විද්‍යාලයේ සිසුන්ට බෙදාදීම සඳහා 2018 ජුනි 13 දින ලබාදී තිබූ යකඩ පෙති 28,584 ක් අතරින් පෙති 18,168 ක් පාසල් පරිශ්‍රය තුළ වලදමා තිබියදී 2020 පෙබරවාරි 14 දින ගොඩගෙන තිබුණි. | මේ පිළිබඳ අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | බෙහෙත් පෙති පාසල්වලට නිකුත් කිරීමේදී වෛද්‍ය නිලධාරියාගේ අත්සනින් යුතු ලිපියකින් නිකුත් කිරීමට හා කලාප කාර්යාලයට පිටපතක් එවීමට හා විධිමත් ලේඛන පවත්වාගෙන යාමටත් කළුතර කලාපයේ සියළුම විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත. |

## 5.3 දෘෂ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ගම්පහ අධ්‍යාපන කලාපයේ දෙකටන පද්මාවතී මහා විද්‍යාලයට බස් රථයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | විදුහල්පතිවරයා සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතු වේ. | බස් රථය මිලදී ගැනීමට අදාළ ගැටළු සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීම 2020.07.07 දිනැති ලිපියකින් දන්වා ඇත. |
| (i) මෙම විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සංගමයේ 2013 ඔක්තෝබර් 30 දින පැවති මහා සභා රැස්වීමේදී පාසලට බස්රථයක් මිලදී ගැනීම සඳහා තීරණය කර තිබුණු අතර ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමැතිය ලබාදී තිබුණි. මේ සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිට ආදි ශිෂ්‍ය සංගමයේ බැංකු ගිණුමට රු.6,645,348 ක් බැර කර තිබූ නමුත් මෙම මුදලින් රු.5,073,400 ක් වෙනත් කාර්යයන් සඳහා වැය කර තිබුණි. | | |
| (ii) බස් රථය මිලට ගැනීමට මූලික ගෙවීමක් වශයෙන් 2018 නොවැම්බර් 19 හා 30 යන දිනයන්හිදී රු.1,200,000 ක් මෝටර් රථ අලෙවි ආයතනයකට ගෙවා තිබූ අතර රු.2,700,000 ක ඉතිරි ගෙවීම සඳහා කල්බදු මූල්‍ය සමාගමකින් චක්‍රීය ණය පහසුකමක් ලබා ගැනීමට විදුහල්පතිවරයා ක්‍රියාකර තිබුණි. මෙම බස්රථය 2019 ජනවාරි 01 දින විදුහල්පතිවරයාගේ පෞද්ගලික නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු අතර | විදුහල්පතිවරයා සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතු වේ. | විදුහල්පති අදාළ සියළු නිරීක්ෂණයන් පිළිගෙන ඇත. මූලික විමර්ශනයක් සඳහා 2020.07.07 දිනැති ලිපියෙන් මණ්ඩලයක් පත්කර ඇති බවද දක්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | 2020 ජූලි මාසය වන විට විදුහල්පතිවරයා වෙනත් පාසලකට මාරු කිරීම හැර වෙනත් ක්‍රියාමාර්ගයක් අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් විසින් ගෙන නොතිබුණි. | | |
| (iii) | බස්රථය මිලදී ගැනීම සඳහා විදුහල්පතිවරයා විසින් පාසල් සංවර්ධන අරමුදලින් රු.700,000 ක් ලබාගත් බව අනාවරණය වූවද බස් රථය මිලදී ගැනීම සඳහා සියළු ගෙවීම් කර තිබුණේ ආදි ශිෂ්‍ය සංගමය විසින් රැස් කර ගෙන තිබූ පරිත්‍යාග මුදලින් විය. | විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු බව. | පාසල් සංවර්ධන අරමුදලෙන් බස් රථය මිලට ගැනීම සඳහා රු.700,000 ක මුදලක් ලබාගෙන ඇති අතර රු.183,428 ක් ගෙවූ බවට වවුචර් අංක සඳහන් කර නොමැති මුදල් භාරගත් බවට අත්සන් තබා ඇති වවුචර්පතක්ද ඉදිරිපත් කර තිබුණි. |
| (iv) | 2018 වර්ෂයේ උසස් පෙළ පන්ති සඳහා සහ 2019 වර්ෂයේ 6 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කරගැනීමේදී පාසැල් සංවර්ධන සමිතියට ලබාගත් රු.2,373,580 ක් රජය මඟින් නිකුත් කර ඇති මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට පටහැනිව විදුහල්පතිවරයා විසින් අවභාවිතා කර තිබුණි. | විදුහල්පතිවරයා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු වේ. | 2020.08.14 දින සිට රාජකාරි නිල වැඩ තහනම් කර ඇත. |
| (v) | කුවිතාන්සි පොත් අනුව 2018 වර්ෂයේදී සිසුන් 191 දෙනෙකුගෙන් රු.600 බැගින් ලබාගත් බවට තහවුරු වුවද, කුවිතාන්සි කිහිපයක මුල් පිටපතේ වටිනාකම හා කාබන් පිටපතේ වටිනාකම වෙනස් කර තිබුණි. 2019 වර්ෂයේ 6 ශ්‍රේණියේ සිසුවෙකුගෙන් රු.4,260 බැගින් සිසුන් 276 දෙනෙකුගෙන් රු.1,180,380 ක් එකතුවී තිබුණු අතර එයින් පාසල් සංවර්ධන ගිණුමට බැර කර තිබුණේ රු.166,200 ක් | විනයානුකූලව කටයුතු කළ යුතු වේ. | රාජ්‍ය මුදල් අවභාවිතා කොට හා නීතිරීතිවලට අනුකූලව කටයුතු කර නොමැති බව සෘජුවම නිරීක්ෂණය වේ. |

| | | | |
|---|---|---|---|
| | පමණි. ඉතිරි රු.1,014,180 ක මුදල භෞතිකව නොතිබූ අතර වියදම් දරා ඇති බවට ලිඛිත සාක්ෂිද නොතිබුණි. | | |
| (ආ) | 2017 ඔක්තෝබර් 30 දිනැති බස්නාහිර පළාත් සභාවේ සභා කටයුතු කාරක සභා රැස්වීමේ වාර්තාව අනුව ධූරධාරීන්ගේ කාමර, සියළු කමිටු කාමර සහ සභා ශාලාව තුළ වේලා පාලන පද්ධතියක් (Master Clock System) සවි කිරීමට සහ සභා ශාලාවේ සභා ලේකම් කාමරයේ හා සභා ලේකම් කාර්යාල පරිශ්‍රයේ Digital ඔරලෝසු සවි කිරීමට තීරණය කර තිබුණි. නමුත් එම තීරණයට පටහැනිව සම්පූර්ණ පළාත් සභා ගොඩනැගිල්ලටම අදාළ වන පරිදි එකක් රු.35,387 බැගින් Analog ඔරලෝසු 142 ක් සහ එකක් රු.96,471 බැගින් Digital ඔරලෝසු 27 ක් ප්‍රසම්පාදනය කර ඒ සඳහා රු.12,939,346 ක් වැය කර තිබුණි. | අනවශ්‍ය වියදම් නොදැරීමට වග බලාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | පළාත් මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන අංශය විසින් 2019 වර්ෂයේ පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) යටතේ ප්‍රජා බහුකාර්ය ගොඩනැගිලි සංවර්ධන කිරීමේ ව්‍යාපෘති 28 ක් සඳහා රු.21,430,290 ක් ප්‍රතිපාදනය කර රු.19,907,144 ක් වියදම් කර තිබුණි. ප්‍රජා බහුකාර්ය ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ බහු කාර්ය ගොඩනැගිලිවල භෞතික පරීක්ෂාවන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.<br>(i) තෝරා ගන්නා ලද එම ගොඩනැගිලි 28 ම ගම්පහ දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය | ව්‍යාපෘති අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීමේදී බස්නාහිර පළාත තුළම සංවර්ධන කටයුතු බෙදීයන ආකාරයට කටයුතු කළ යුතු වීම හා පැවරිය හැකි උපරිම කොන්ත්‍රාත් ගණන දක්වා පමණක් ප්‍රජා සංවිධාන සඳහා කොන්ත්‍රාත් ලබාදිය යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

ලේකම් කොට්ඨාශයකට පමණක් සීමා වී තිබුණි.

(ii) එක් ප්‍රජා සංවිධානයකට එක වරකට ලබාදිය හැකි උපරිම කොන්ත්‍රාත් ගණන 03 ක් වියයුතු වුවත් එක් ප්‍රජා සංවිධානයකට එකවර කොන්ත්‍රාත් 18 ක සංවර්ධන කටයුතු පවරා තිබුණි.

(iii) ප්‍රජා සංවිධානයට ගෙවීම් කිරීමේදී සංවිධානයේ සාමාජිකයෙකුට චෙක්පත් භාරදිය යුතු වුවත් බාහිර පුද්ගලයෙකුට හා අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට චෙක්පත් භාරදී තිබුණි.

**5.4 ආර්ථික නොවූ ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7(2)(ඇ) වගන්තිය ප්‍රකාර පළාත් සභාව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම වනතෙක් සභාපති ධුරය හිස් නොකළ යුතු වීම නිසා එම තනතුරට පමණක් වැටුප් ගෙවිය හැකි නමුත් පළාත් සභා කටයුතු ක්‍රියාත්මක නොවන කාලසීමාවකදී සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ලෙස රු.3,972,724 ක් ගෙවා තිබුණි. 2018 ඔක්තෝබර් 12 දිනැති අංක සීඑස්/සීඑස්ඒ/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබියදී 2019 අප්‍රේල් 22 දින සිට දෙසැම්බර් දක්වා පළාත් සභා සභාපතිවරයාට මාසිකව නිවාස කුලී රු.50,000 බැඟින් රු.400,000 ක් සහ දුරකථන දීමනා ලෙස මාසිකව ගෙවනු ලබන රු.25,000 ට අමතරව 2019 වර්ෂය සඳහා රු.56,990 ක්ද ගෙවා තිබුණි. මීට අමතරව සභාව විසුරුවා හැරීමෙන් පසුව සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ 11 දෙනෙකු සඳහා අතිකාල දීමනා සහ ගමන් වියදම් වශයෙන් රු.395,800 ක් ගෙවා තිබුණි. | පළාත් සභා පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 5.5 හඳුනා ගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශ 02 ක් සහ දෙපාර්තමේන්තු 09 ක් විසින් අයකර ගත යුතුව තිබුණු අලාභ හානි වටිනාකම රු.58,281,135 ක් විය. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.5,309,144 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර වර්ෂය අවසන් වනවිට තව දුරටත් රු.52,971,991 ක් අයකර ගත යුතුව තිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 5.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 5.6.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ලේකම්ගේ 2019 වර්ෂයේ පළාත් සංවර්ධන ප්‍රදාන යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශයේ ග්‍රාම සංවර්ධන අංශය විසින් අනුගමනය කලයුතු උපදෙස් නොසලකා අවමංගල්‍යාධාර සමිති 66 ක් සඳහා රු.3,700,000 ක් වටිනා ශබ්ද විකාශන යන්ත්‍ර ලබාදී තිබුණි. තවද ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එකම ග්‍රාම නිලධාරී වසමට අයත් එකම පුද්ගලයෙකු සභාපතීත්වය දරන මරණාධාර සමිති 2ක් හා ග්‍රාම සංවර්ධන සමිතියක් වෙනුවෙන් එකම පුද්ගලයාට ශබ්ද විකාශන යන්ත්‍ර 03ක් ලබාදී තිබුණු අතර මරණාධාර සමිති දෙකටම අදාළව අයදුම්පත්‍රවල එකම ලිපිනය සඳහන් කර තිබුණි. | ප්‍රධාන ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 5.6.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ 2019 ජනවාරි සිට මාර්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ අනුමත කරන ලද සහ ක්‍රියාත්මක කිරීමට නියමිත | අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.132,840,050 ක්වූ ව්‍යාපෘති 100 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අවසන් කිරීමට අපොහොසත්වී තිබුණි. | පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. | |
| (ආ) | කළුතර දිස්ත්‍රික්කයේ කටුගහහේන රෝහලේ බාහිර රෝගී අංශය සහිත තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම 2015 දෙසැම්බර් 19 දින රු.66,869,349 ක ප්‍රතිපාදන මත ආරම්භ කර 2020 ජූලි 01 දින දින දීර්ඝ කිරීම සිදු කර තිබූ අතර ප්‍රමාද වූ කාලය වර්ෂ 05 ක් විය. | කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.6.3 අත්හැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 08 ක ප්‍රතිලාභී ලැයිස්තු හා අවශ්‍යතා ලේඛන ලබාදී නොතිබුණු බැවින් රු.1,900,000 ක් වටිනාකමැති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. | මහජන අවශ්‍යතා පිළිබඳව වැඩි අවධානය යොමු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.7 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙකටන පද්මාවතී විදුහලේ උසස් පෙළ පන්තිවලට ඇතුළත්ව තිබූ සිසුන් 213 දෙනෙකුගෙන් රු.1,640,100 ක් රැස් කර තිබූ නමුත් පාසැල් සංවර්ධන සමිති ගිණුමට බැර කර තිබුණේ රු.284,000 ක් පමණි. ඒ අනුව ගිණුමට බැර නොකර අත රඳවාගෙන තිබූ මුදල රු.1,356,100ක් වූ අතර මේ සම්බන්ධයෙන් කලාප අධ්‍යක්ෂවරයා විසින් සිදු කරන ලද පරීක්ෂාවේදී රු.1,181,000 ක් ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වෙත ලබා දී තිබූ බවත් ඉතිරි රු.175,100 ක මුදල වියදම් කළ ආකාරය අපැහැදිලි බවත් අනාවරණය කරගෙන තිබුණි. | විදුහල්පතිවරයා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2020.08.14 විදුහල්පතිවරයා කොන්දේසිවලට යටත්ව වහාම ක්‍රියාත්මක වන පරිදි රාජකාරි නිල වැඩ තහනම් කර ඇත. |

**5.8 වත්කම් කළමනාකරණය**

**5.8.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක පසුපස කොටස පෞද්ගලික පාර්ශවයක් විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පැවතුණි. මේ සඳහා ආයතනය සතුව ගිවිසුමක් නොතිබූ අතර කිසිදු මුදලක්ද අයකරගෙන නොතිබුණි. | අයිතිය තහවුරු කරගෙන ඉඩම් කොටස ආපසු ලබාගත යුතු වේ. | අයිතිය තහවුරු කර ගැනීම සම්බන්ධව පළාත් ඉඩම් කොමසාරිස් හා මීගමුව ප්රාදේශීය ලේකම් විසින් කටයුතු කරමින් පවතී. |
| (ආ) | දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 11 පර්චස් 26 ක රජයේ ඉඩමක් 1989 වර්ෂයේදී බදු දී තිබූ අතර එම ඉඩම බදුකරුවන් විසින් ව්‍යාජ ඔප්පු සකස් කර පුද්ගලයින් 20 දෙනෙකුට විකුණා තිබුණි. | වගකිවයුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 28 රූඩ් 02 පර්චස් 34 ක ඉඩමක් බදු දී තිබූ අතර එම ඉඩමට බදුකරු විසින් ව්‍යාජ ඔප්පු සකසා ඉඩම් වෙන්දේසි කරන සමාගමකට විකුණා තිබුණි. | වගකිවයුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | ලියාපදිංචිය අවසන් කරන ලද සී/ස කොළඹ - උතුර සමූපකාර සමිතියට අයිතිව තිබූ කොළඹ 12, වේල්ල වීදියේ අංක 238 දරන ඉඩමේ මුළු වපසරිය වූ පර්චස් 11.09 න් පර්චස් 03 ක සිටි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමෙන් තොරව ඉතිරි පර්චස් 08.09 සඳහා 2013 සැප්තැම්බර් 18 දින නව පිඹුරුපතක් සකස් කර රු.20,417,619 කට අලෙවි කර තිබුණි. නමුත් කොළඹ මහ නගර සභාව විසින් මෙම පිඹුරුපත අනුමත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ඉඩම මිලට ගත් පාර්ශවයද අගතියට පත්වී තිබුණි. එමෙන්ම අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටින පර්චස් 03 ක ඉඩම් ප්‍රමාණය නැවත අත්පත් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අගතියට පත් පාර්ශවයට සාධාරණය ඉටු කිරීම හා අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.8.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් නියෝග අංක 201(1) ප්‍රකාරව ක්‍රීඩා සමාජවලට වාර්ෂික බදු මුදල ගණනය කිරීම සිදුකළ යුත්තේ ඉඩමේ නොදියුණු වටිනාකමින් සියයට 02 බැගිනි. නමුත් 1991 වර්ෂයේදී බදු දෙන ලද අංක මු.පි.කො.6995 ට අදාළ ඉඩමේ තක්සේරු වටිනාකම වන රු.125,000,000 න් සියයට ½ ක බදු මුදලක් පමණක් අයකර තිබුණි. ඒ අනුව වාර්ෂිකව අයකළ යුතු බදු වටිනාකම රු.2,500,000 ක් වුවත් රු.625,000 ක් පමණක් අය කර තිබීම හේතුවෙන් ඉඩමේ බදු ගිවිසුමේ කාලය වන වර්ෂ 30 ක් සඳහා පළාත් සභාවට සිදුකර තිබුණු පාඩුව රු.56,250,000 ක් විය. | බදු ගිවිසුම් නැවත ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.8.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයතන 18 ක් විසින් මුල්‍ය රීති 250 ප්‍රකාර භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවත් ආයතන 03 ක උප කාර්යාලවල පමණක් භාණ්ඩ සමීක්ෂණ කර තිබුණු අතර ප්‍රධාන කාර්යාලයේ සමීක්ෂණ සිදුකර නොතිබුණි. | මුල්‍ය රීති 250 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ආයතන 05 කට අදාළව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌනතා, අතිරික්තතා හා සමීක්ෂණ මණ්ඩලය විසින් සිදුකර ඇති නිර්දේශ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

**5.9.1 පාසැල් කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 දෙසැම්බර් 31 දිනැති අංක ED/1/27/1/5/1/2007 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව එකම පාසලේ වසර 10 ක් සම්පූර්ණ කර ඇති ගුරුභවතුන් ස්ථාන මාරු කළ යුතු වුවද බප/ගම් බණ්ඩාරවත්ත පරාක්‍රම මහා විද්‍යාලයේ ගුරුභවතුන් 19 දෙනෙකු වසර 10 කට වැඩි කාලයක් එම පාසලේ සේවය කරමින් පැවතුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.9.2 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු රෝගය මැඩපැවැත්වීම අරමුණු කරගෙන 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත ක්ෂේත්‍ර මදුරු මර්ධන සහායක නිලධාරීන් බඳවාගෙන තිබුණු අතර 2019 වර්ෂයේදී එම නිලධාරීන් 110 ක් වෙනුවෙන් රු.25,675,742 ක දීමනා ගෙවා තිබුණි. එහෙත් වසර 03 කට පෙර සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් එම නිලධාරීන් සේවයේ ස්ථිර කිරීමට හෝ කොන්ත්‍රාත් කාලය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවය සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**5.10 පළාත්පාලන බල මණ්ඩල අධීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 49 කට අදාළ හිඟ ආදායම රු.6,969,680,020 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් පාලන බල මණ්ඩල 06 ක නිලධාරීන්ට / වෙනත් අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර 25 කට අදාලව 2019 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබූ අධිභාරවල වටිනාකම රු.32,682,529 ක් විය. | අධිභාර මුදල් වගකිව යුතු අයවලුන්ගෙන් අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 6.1 ක්‍රියාකාරී සැලැස්ම

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2014 අප්‍රේල් 01 දිනැති අංක 07/2014 දරන බස්නාහිර පළාත් මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | කොවිඩ් වසංගතය නිසා වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. |

### 6.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රම සවිය වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2018 අගෝස්තු 15 දින අනුමත කර තිබූ රු.ලක්ෂ 75 ක මුදලින් 2018 වර්ෂයේ අයවැය යෝජනාවලට ඇතුලත් කර නොතිබූ කෘෂිකාර්මික භාණ්ඩ මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර රු.7,436,845 ක් ගෙවා තිබුණි. එම මිලදී ගැනීම තුළ රු.596,625 ක් වටිනා තණකොළ කපන යන්ත්‍ර 35 ක් ඇතුළත්ව තිබුණි. එසේම 2019 ජනවාරි 11 දින නැවතත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තණකොළ කපන යන්ත්‍ර 85 ක් රු.1,705,500 කට මිලදීගෙන තිබූ අතර මිලදීගෙන තිබූ තණකොළ කපන යන්ත්‍ර 100 ක් "සිතමු" ව්‍යාපෘතිය යටතේ සභාපති විසින් තෝරාගන්නා ලද පිරිසකට බෙදාහැර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ මෘත ශරීරාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු, 2017 ජුනි 14 දින ගිවිසුම්ගත වටිනාකමින් සියයට 30 ක්වූ රු.6,590,273 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඉදිකිරීම් ආයතනයක් වෙත පවරාදී තිබුණි. ඉදිකිරීම් අවසන් කිරීමට නියමිත කාලය ඉක්මවීමෙන් පසුවද, අත්තිවාරම පමණක් දමා ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබුණි. 2016 දෙසැම්බර් 16 දිනැති ඇප බැඳුම්කරය මුදල් කරගෙන නොතිබුණු අතර කළවැඩ වටිනාකම වූ රු.2,673,327 ක් අඩුකිරීමෙන් පසු රු.3,916,946 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | ඇප බැඳුම්කරය මුදල් කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම හා කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් සුදුසු කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

**6.3 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියත්, එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා 2019 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම් පවරා නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු ළඟාකර ගැනීම සඳහා සැලසුම් සැකසිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |